**1.** **තනතුර - ජලනල කාර්මික/ ජල මෝටර් ක්‍රියාකරු**

**2.** **වයස -** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

i. ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් සුදුසුකම් වලින් 2න් එකක් සපුරා තිබිය යුතුය.)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

ii. ජලනල කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. නතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 3 - 2025

මූලික වැටුප - රු. 40,834.00 (2026), රු. 43,280.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,834.00 + 17800.00 x 12 = රු.703,608.00(2026)

43,280.00 + 17800.00 x 12= රු.732,960.00(2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් සඳහා සුදුසු ජල නල පද්ධති ස්ථාපනය කිරීම, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු පිළිබඳ සොයා බලා කටයුතු කිරීම.

ii. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් ආසන්නයෙහි පිහිටි පාවච්චයට සුදුසු ජල මූලාශ්‍ර ඇත්තම් කාර්යාංශ උපදෙස් මත සවි කරනු ලබන ජලය පොම්ප කරනු ලබන යන්ත්‍ර ඇත්තම් ඒවා පිළිබඳ සොයා බලා නඩත්තු කිරීම.

iii. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ඇති ජල නල පද්ධතින්ගේ අලුත්වැඩියාවන් ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ යොදා නිවැරදිව සිදු කිරීම.